# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 41/3 — 1973 ජනවාරි 08 වැනි සඳුද — 1973.01.08

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්ඩී/බී. 177 හා/31.

### දුම්රිය ආඥාපණත

දුම්රිය ආඥා පණතේ (200 වන අධිකාරයෙහි) 3 සහ 4 ආ යන වගන්ති මගින් තමා වෙත පැවරී ඇති බලතල යටතේ මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ප්‍රවාහණ ඇමතිවරයා විසින් පනවා ඇති ව්‍යවස්ථා :—

ලෙස්ලි ගුණවර්ධන;
ප්‍රවාහණ ඇමති.

කොළඹ,
1973 ජනවාරි 4 දින.

### රීති

1926 පෙබරවාරි 26 දින සහ අංක 7,514 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පතේ අතිරේකයෙහි පළ කරන ලද මගී සහ බඩු දුම්රිය ගමනා ගමනය සහ ගාස්තු සහ බඩු වර්ග කිරීම පිළිබඳ වූ, වරින් වර සංශෝධිත රීති 1973 ජනවාරි 15 දින සිට පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) මගී දුම්රිය වලින් මගීන් සහ පාර්සල් ආදිය ප්‍රවාහණය කිරීම පිළිබඳව සඳහන් වන කොටසෙහි—

(1) " මගීන් " යන ශීර්ෂය යටතේ—

(අ) 20 සහ 27 (ආ) යන රීති අස් කිරීමෙන් හා

(ආ) 29 වැනි රීතියෙහි (ආ) ඡේදයට ඉක්බිතිව පහත සඳහන් නව ඡේදය ආදේශ කිරීමෙන්,

" (ඇ) වාර ප්‍රවේශ පත්‍රයක් දරණ මගියෙකුට තම වාර ප්‍රවේශ පත්‍රයෙන් නොමිලයේ රාත්තල් 28 කට නොවැඩි බර ප්‍රමාණයක ගමන් බඩු ගෙන යාමට ඉඩ දෙනු ඇත."

(2) " මගීන්ගේ ගමන් බඩු " යන ශීර්ෂය යටතේ 33 වන රීතියෙහි—

(අ) (ඊ) ඡේදයෙහි.

(i) " 112 " සංඛ්‍යා වෙනුවට " 84 " සංඛ්‍යා ද,

(ii) " 84 " සංඛ්‍යා වෙනුවට " 70 " සංඛ්‍යා ද,

(iii) " 70 " සංඛ්‍යා වෙනුවට " 56 " සංඛ්‍යා ද ආදේශ කිරීමෙන්,

(ආ) (ඊ) ඡේදයෙහි (ii) උප ඡේදයෙහි " පළමුවැනි පන්තියේ ප්‍රවේශ පත්‍රයක් දරන්නේ නම්, හොණ්ඩර දෙකක් ද, දෙවැනි පන්තියේ ප්‍රවේශ පත්‍රයක් දරන්නේ නම්, හොණ්ඩර 1 යි කාර්තු 2 ක් හා තුන්වන පන්තියේ ප්‍රවේශ පත්‍රයක් දරන්නේ නම් හොණ්ඩර 1 යි කාර්තු 1 ක් ද, දක්වා " යන වචන සහ සංඛ්‍යා වෙනුවට පළමුවැනි පන්තියේ ප්‍රවේශ පත්‍රයක් දරන්නේ නම්, හොණ්ඩර 1 යි කාර්තු 2 ක් ද, දෙවන පන්තියේ ප්‍රවේශ පත්‍රයක් දරන්නේ නම්, හොණ්ඩර 1 යි කාර්තු 1 ක් ද, තුන්වන පන්තියේ ප්‍රවේශ පත්‍රයක් දරන්නේ නම්, හොණ්ඩර 1 ක් ද දක්වා " යන වචන සහ සංඛ්‍යා ආදේශ කිරීමෙන්.

(3) " පාර්සල් " යන ශීර්ෂය යටතේ—

(අ) 50 (i) වැනි ව්‍යවස්ථාවේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් නව (අ) ඡේදය ආදේශ කිරීමෙන්—

" (අ) අශ්වයින් හා අශ්ව කරත්ත ප්‍රවාහනය කරනු ලබන්නේ අයිතිකරුවන්ගේ වගකීම මත වන අතර, ඒවා ප්‍රවාහණය කිරීමේ ගාස්තු පහත දැක්වේ :—

| | සැතපුමකට රු. ශ. |
|---|---|
| අශ්වයින් එකෙක් ... ... ... ... ... ... | 1 10 |
| අශ්වයින් දෙදෙනෙක් ... ... ... ... ... | 1 20 |
| අශ්වයින් තිදෙනෙක් ... ... ... ... ... | 1 35 |
| අශ්වයින් සතර දෙනෙක් (කැළණිවැලි මාර්ගයේ) ... ... ... ... | 1 65 |
| අශ්වයින් සතර දෙනෙක් (කැළණිවැලි මාර්ගය හැර සෙසු මාර්ගවල) ... ... ... | 2 40 |
| අශ්වයින් පස් දෙනෙක් ... ... ... ... ... | 2 55 |
| අශ්වයින් සය දෙනෙක් ... ... ... ... ... | 2 65 |
| අශ්ව කරත්ත එකක් ... ... ... ... ... | 1 10 |
| අශ්ව කරත්ත දෙකක් ... ... ... ... ... | 1 35 |
| අශ්ව කරත්ත දෙකක් හෝ ඊට වැඩි ගණනක් බෝගී ට්‍රක් රථයකින් ... ... ... | 2 65 |

එසේ වුවද, ඒ සඳහා රෝද හතරේ ට්‍රක් රථයක් පාවිච්චි කරනු ලබන්නේ නම්, අශ්ව පෙට්ටියක් හෝ පෙට්ටි රථයක් සඳහා අයකළයුතු ගාස්තුව රු. 30 කට නොඅඩු විය යුතු වන අතර, පාවිච්චි කරනු ලබන්නේ බෝගී ට්‍රක් රථයක් නම්, එම ගාස්තුව රු. 60 කට නොඅඩු විය යුතුය."

(ii) (ඉ) ඡේදයෙහි—

(අ) " රුපියල් 25 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 30 " යන වචනය හා සංඛ්‍යා ද,
(ආ) " රුපියල් 6.25 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 7.50 " යන වචනය හා සංඛ්‍යා ;,
(ඇ) " රුපියල් 50 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 60 " යන වචනය හා සංඛ්‍යා ද,
(ඈ) " රුපියල් 12.50 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 15 " යන වචනය හා සංඛ්‍යා ද ආදේශ කිරීමෙන්,

(iii) (ඊ) ඡේදයෙහි—

(අ) (i) " රුපියල් 6.25 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " රුපියල් 7.50 " යන වචනය සහ සංඛ්‍යා ද,
(ii) " රුපියල් 12.50 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 15 " යන වචනය හා සංඛ්‍යා ආදේශ කිරීමෙන්,
(ආ) 51 වැනි ව්‍යවස්ථාවේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන නව ඡේදය ආදේශ කිරීමෙන්,

" (ආ) (ඊ) ඡේදයෙන් ඉඩදී ඇති පරිදි හැර විදුලිය, ගෑස්, තෙල් හෝ පැට්රෝල් වලින් යෙදූ, අයිතිකරුගේ වගකීම පිට ප්‍රවාහණය කෙරෙන මෝටර් රථ සඳහා ගාස්තු අයකරනු ලබන්නේ පහත දැක්වෙන පරිද්දෙනි :—

| | සැතපුමකට රු. ශ. |
|---|---|
| මෝටර් රථයක් සාමාන්‍ය ට්‍රක් රථයක ... ... ... ... | 1 0 |
| මෝටර් රථයක් බෝගී ට්‍රක් රථයක ... ... ... ... | 2 0 |
| මෝටර් රථ දෙකක් බෝගී ට්‍රක් රථයක ... ... ... ... | 3 0 |
| මෝටර් රථයක් සහ ට්‍රේලරයක් එක් සාමාන්‍ය ට්‍රක් රථයක ... ... ... | 1 20 |
| මෝටර් කාර් එකක් සහ ට්‍රේලරයක් එක් බෝගී ට්‍රක් රථයක ... ... ... | 2 40 |
| මෝටර් බයිසිකලයකට ... ... ... ... ... | 0 28 |
| ඉදිරිපස බඩු ගෙන යන පෙට්ටියක් හෝ පැති වාහනයක් සහිත මෝටර් ට්‍රයිසිකලයකට හෝ මෝටර් බයිසිකලයකට ... ... ... ... ... | 0 56 |
| ඔටෝ සයිකලයක් හෝ මෝටර් ස්කූටරයකට ... ... ... | 0 14 |

එසේ වුවද, එබඳු වාහනයක් ප්‍රවාහණය කිරීම සඳහා අය කෙරෙන ගාස්තුව පහත දැක්වෙන ගාස්තුවලට නොඅඩු විය යුතුය :—

| | රෝද හතරේ ට්‍රක් රථයක් පාවිච්චි කළ කල්හි රු. ශ. | | බෝගී රථයක් (රෝද අටේ) පාවිච්චි කළ කල්හි රු. ශ. |
|---|---|---|---|
| මෝටර් කාර් දෙකක් ... ... ... | 30 0 | ... | 60 0 |
| මෝටර් කාර් එකක් හා ට්‍රේලරයක් ... ... | 30 0 | ... | 60 0 |
| මෝටර් බයිසිකලයක්, මෝටර් ස්කූටරයක් හෝ ඔටෝ සයිකලයක් ... | 7 50 | ... | 15 0 |
| මෝටර් ට්‍රයිසිකලයක් හෝ ඉදිරියේ පෙට්ටියක් හෝ පැති වාහනයක් සහිත මෝටර් බයිසිකලයක් ... ... ... | 15 0 | ... | 30 0 " |

(ඇ) 53 වැනි ව්‍යවස්ථාවෙහි—
(i) " ශත 90 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 1.10 " යන වචනය හා සංඛ්‍යා ද,
(ii) " රුපියල් 1 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 1.20 " යන වචනය හා සංඛ්‍යා ද,
(iii) " රුපියල් 1.10 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 1.35 " යන වචනය හා සංඛ්‍යා ද,
(iv) " රුපියල් 25 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 30 " යන වචනය හා සංඛ්‍යාද ආදේශ කිරීමෙන්,

(ඈ) 54 වැනි ව්‍යවස්ථාවෙහි (අ) ඡේදයේ " ශත 80 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 1 " යන වචනය හ, සංඛ්‍යා ආදේශ කිරීමෙන්,

(ඉ) 55 වැනි ව්‍යවස්ථාවෙහි—
(i) " ශත 4½ " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " ශත 5½ " යන වචනය හා සංඛ්‍යා සහ,
(ii) " රුපියල් 1.25 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 1.50 " යන වචනය හා සංඛ්‍යා ආදේශ කිරීමෙන්

(ඊ) 56 වැනි ව්‍යවස්ථාවෙහි " රුපියල් 5 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 6 " යන වචනය හා සංඛ්‍යා ආදේශ කිරීමෙන්,

(උ) 57 වැනි ව්‍යවස්ථාවෙහි " රුපියල් 2.50 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 3 " යන වචනය හා සංඛ්‍යා ආදේශ කිරීමෙන්,

(ඌ) 59 වැනි ව්‍යවස්ථාවෙහි—
(i) " රුපියල් 1.65 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 2 " යන වචනය හා සංඛ්‍යා, සහ
(ii) " රුපියල් 25 " යන වචනය හා සංඛ්‍යා වෙනුවට " රුපියල් 30 " යන වචනය හා සංඛ්‍යා ඇදේශ කිරීමෙන්,

(එ) 60 වැනි ව්‍යවස්ථාවේ—
(i) (ඊ) ඡේදයෙහි උප ඡේද (i) හි " 15 " සංඛ්‍යා වෙනුවට " 20 " සංඛ්‍යා ද,
(ii) (ඊ) ඡේදයෙහි උපඡේද (ii) හි " 30 " සංඛ්‍යා වෙනුවට " 35 " සංඛ්‍යා ද,
(iii) (ඊ) ඡේදයෙහි උපඡේද (iii) හි " 60 " සංඛ්‍යා වෙනුවට " 75 " සංඛ්‍යා ද ආදේශ කිරීමෙන්,

(4) " තබා යන ගමන් බඩු " යන ශීර්ෂය යටතේ—
(අ) 61 වැනි ව්‍යවස්ථාවෙහි—

(ආ) ඡේදයේ—
(අ) " ශත 15 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " ශත 20 " යන වචනය හා සංඛ්‍යා ද,
(ආ) " ශත 10 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " ශත 15 " යන වචනය සහ සංඛ්‍යා ද,
(ඇ) " ශත 35 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " ශත 45 " යන වචනය සහ සංඛ්‍යා ආදේශ කිරීමෙන් ද,

(ii) (ආ) ඡේදයේ—
(අ) " ශත 75 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " ශත 90 යන වචනය සහ සංඛ්‍යා ද,
(ආ) " ශත 30 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " ශත 35 " යන වචනය සහ සංඛ්‍යා ද ආදේශ කිරීමෙන්,

(5) නැතිවූ හෝ හිමිකම් නොපෑ බඩු බාහිරාදිය යටතේ—

62 වැනි ව්‍යවස්ථාවෙහි (ආ) ඡේදයෙහි " ශත 50 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " ශත 60 " යන වචනය සහ සංඛ්‍යා ආදේශ කිරීමෙන්.

(ආ) බඩු ප්‍රවාහණය සම්බන්ධයෙන් අදාළ වන කොටසෙහි—

(1) 10 වැනි ව්‍යවස්ථාවෙහි (උ) (v) ඡේදයෙහි " ශත 50 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " රු. 1 " යන වචනය සහ සංඛ්‍යා ආදේශ කිරීමෙන් ද,

(2) 11 වැනි ව්‍යවස්ථාවෙහි , (අ) (ආ) (ඇ) යන ඡේද වෙනුවට පහත සඳහන් නව ඡේද ආදේශ කිරීමෙන් :—

" (අ) බර රා. 112 ට අඩු, වෙන් වෙන්ව ඇසුරූ බඩු මිටි, බඩු වශයෙන් භාරගනු ලබන අතර, ඒ වෙනුවෙන් රා. 112 කට අය කෙරෙන ගාස්තුවම අයකරනු ලැබේ.

(ආ) බඩු තොගයේ බර හොණ්ඩරයකින් කවර කොටසක් වුවත්, එය රා. 112 ට ගණන් ගනු ලැබේ.

(ඇ) බඩු තොගයක් වෙනුවෙන් අය කෙරෙන අඩුම ගාස්තුව රුපියල් 1" කි.

(3) 23 ව්‍යවස්ථාවෙහි (අ) ඡේදයෙහි—

(අ) (i) " රු. 3 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " රු. 5 " යන වචනය සහ සංඛ්‍යා ද,

(ii) " රු. 15 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " රු. 25 " යන වචනය සහ සංඛ්‍යා ද ආදේශ කිරීමෙන්,

(iii) (අ) ඡේදය අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්,

" එබඳු කාල සීමාවන් දෙකක් සම්පූර්ණ වීමෙන් පසුව, වැගනය තවදුරටත් ප්‍රමාද කරනු ලැබේ නම්, එසේ තවදුරටත් ප්‍රමාද කෙරෙන එක් එක් වැඩ කරන පැය 6 ක හෝ පැය 8 ක කාලසීමාවන් සඳහා ඒ ඒ ස්ථානයන්ට අනුචිත පරිදි රුපියල් 40 ක උපරිම ගාස්තුවකට යටත්ව වැඩ කරන එක් පැයක් හෝ ඉන් කොටසක් සඳහා අයකෙරෙන ප්‍රමාද කිරීම් ගාස්තුව රුපියල් 5 බැගින් වේ."

(ආ) (උ) ඡේදය වෙනුවට පහත සඳහන් නව (උ) ඡේදය ආදේශ කිරීමෙන්,

" (උ) නිශ්චිත වශයෙන් රාත්‍රී බඩු පැටවීම සඳහා ප.ව. 4 ට හෝ ඊට පසු ගැල් සපයන ලද අවස්ථාවලදී, ඒවාට පසුදින ප.ව. 4 වන තෙක් බඩු පටවනු නොලැබුවහොත්, ගැල සපයනු ලැබූ අවස්ථාවක්, පෙ.ව. 4 ක් අතර මුළු කාලයටම ගැලකට උපරිම ගාස්තුව රු. 25 කට වැඩි නොවන පරිදි, වැඩ කරන එක් පැයකට හෝ ඉන් කොටසකට රු. 5 ගණනේ ප්‍රමාද කිරීම් අය කරනු ලැබේ."

(4) 33 වැනි ව්‍යවස්ථාවෙහි—(ඉ) ඡේදයෙහි (i) උප ඡේදයෙහි " රුපියල් 15 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " රු. 25 " යන වචනය සහ සංඛ්‍යා ආදේශ කිරීමෙන්,

(5) 36 වෙනි ව්‍යවස්ථාවෙහි " රු. 15 " යන වචනය සහ සංඛ්‍යා වෙනුවට " රු. 25 " යන වචනය සහ සංඛ්‍යා ආදේශ කිරීමෙන්.

1-578

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.